# මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.

## පළමු වාර පරීක්ෂණය 2013

## සිංහල භාෂාව හා සාහිත්‍යය

## 7 ශ්‍රේණිය

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |

කාලය පැය 2 යි

නම : .................................................................................... පන්තිය : ..............................

### I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

★ මිශ්‍ර සිංහල වර්ණ මාලාව ඇසුරින් පහත ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. මිශ්‍ර සිංහල වර්ණ මාලාවට අයත් අක්ෂර ගණන,
   i. 24 කි. ii. 60 කි. iii. 55 කි. iv 30 කි.

2. සඤ්ඤක අක්ෂර පිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,
   i. ඟ , ඦ , ඬ , ඳ , ඹ ii. ග , ජ , ඨ , ධ , භ
   iii. භ , ණ , ඣ , ඞ , ර iv. ඟ , ඹ , ඳ , ඦ , ඬ

3. මිශ්‍ර සිංහල වර්ණ මාලාවට අයත් ස්වර අක්ෂර ගණන,
   i. 10 කි. ii. 15 කි. iii. 25 කි. iv. 18 කි.

★ නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත අකුර තෝරා යටින් ඉරක් අඳින්න.

4. සමස් ______ (ථ / ත)
5. සෞන්දර් ______ (ය්‍ය / යය)
6. පරි ______ ණකය (ග / ෂ)
7. ලේ ______ මි (ක / ඛ)
8. ඉෂ් ______ (ඨ / ට)

★ පහත දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු නාම පදය තෝරා ලියන්න.

9. පෝලිමේ සිටි ________________________________ තම වාරය පැමිණෙන තුරු බලා සිටියේ ය. ( නිමල් / මැණිකා)
10. ________________________________ මහන්සි වී වැඩ කරති. (මිනිසුන් / මිනිස්සු)

★ පහත දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු විධි ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

11. දරුවන් නොබියව ක්‍රීඩා ................................................ (කරයි / කරනු)

12. ජයන්ත දැන් ඉදිරියට ................................................ ( යන්න / යයි )

★ පහත සඳහන් ප්‍රශ්න කියවා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

13. පහත සඳහන් පදවලින් ප්‍රාණවාචී නාම පදයක් වන්නේ,

i. කුරුල්ලා ii. පොත iii. පොළොන්නරුව iv සතුට

14. පහත සඳහන් පදවලින් අතීත කාල බහු වචන ක්‍රියා පදයක් නොවන්නේ,

i. කළෝය ii. බැලූහ iii. දුවති iv. පැන්නෝය

★ පහත දී ඇති පද යුගල පද ලෙස සම්පූර්ණ වීමට යෙදිය හැකි නිවැරදි පදය යටින් ඉරක් අඳින්න.

15. අන්දුන් ..............................

i.කුන්දුන් ii. බැන්දුම් iii. මනන් iv. මාන්දු

16. මහත ..............................

i.මිටි ii. කොට iii. කෙට්ටු iv. දෙහෙත

17. කොල්ලො ........................

i. කෙල්ලො ii. පිරිමි iii. කුරුට්ටො iv. සුරුට්ටු

18. ඇලි ........................

i. ගැලි ii. මැලි iii. දිලි iv. තැලි

★ පහත ප්‍රශ්නවල දී ඇති අර්ථයට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ යටින් ඉරක් අඳින්න.

19. දෙන ලද උදව්ව ද අවශ්‍යම අවස්ථාවේදී නොදී මඟ හරී.

i. කල දුටු කළ වල ඉහගන් අබරෝ කිව්වලු.

ii. වක්කඩේ හකුරු හැංගුවා වගෙයි.

iii. කටුස්සාගේ කරේ රත්රන් බැන්දා වගෙයි.

iv. ගඟ මැදට යද්දි අත්වැල කැඩුවා වගෙයි.

20. නිශ්චිත තීරණයක් ගත නොහැකිව කල් මැරීම.

i. ගඟට ඉනි කැපුවා වගෙයි.

ii. මඩේ හිටවපු ඉන්න වගෙයි.

iii .දියෙහි ඇඳි ඉරක් වගෙයි.

iv. හිල් කූඩෙන් වතුර අදින්නා වගෙයි.

21. තමන්ගෙ නැති බැරිකම් තියෙද්දි අනුන්ට උදව්වට යයි.

i. ගුරුවරුන්ටත් අකුරු වරදිනවලු.

ii. ආඬි හත් දෙනාගෙ කැඳ හැලිය වගෙයි.

iii. අඳින්න නැති එකා බලන්නට හැට්ට මහන්නා වාගෙයි.

iv. කුඩම්මත් ඇවිත් කැවුම් පුංචි කළා වගෙයි.

★ පහත දී ඇති වාක්‍යවලට සුදුසු විරාම ලක්ෂණ වරහන් තුළින් තෝරා ලියන්න.

( , ? . ! / )

22. ඔවුහු සීගිරි පර්වතය මුදුනට ම නැංගහ

23. 1 සිට 100 දක්වා ඉලක්කම් අකුරෙන් ලියන්න

24. අහෝ සිදුවුණ විපතක මහත

★ පහත සඳහන් වාක්‍යවල හිස් තැනට ගැළපෙන අනුක්ත පදය ලියන්න.

25. කොටියා ________________ පසුපස ලුහු බැන්දේ ය.

i. මුව දෙනක් ii. මුවෙක් iii. මුවන් iv. මුවෝ

26. ගුරුතුමිය ________________ සමඟ කාර්යාලයට ගියා ය.

i. ශිෂ්‍යයෙක් ii. ශිෂ්‍යාවක් iii. ශිෂ්‍යයන් iv. ශිෂ්‍යයෝ

27. ________________ වඩා ගත් කාන්තාව ඉක්මන් ගමනින් වෙළඳසැළ වෙත පැමිණියා ය.

i. දැරියකු ii.දරුවෙක් iii. දැරියන් iv. දැරියක

★ පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි පදයේ විරුද්ධ ලිංගික පදය ඉදිරියෙන් ලියන්න.

28. සිඟන්නා සිඟමන් යදිමින් ගෙන් ගෙට යයි. ________________

29. මොනරා ආඩම්බර ලීලාවෙන් පිල් කළඹ විහිදුවයි. ________________

30. ඉස්තාලයේ සිටි වෙළඹ ආහාර ගැනීම ප්‍රතික්ෂේප කළා ය. ________________

## I I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

① කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඔබ නිර්මාණය කළ සංවාද පිටපත ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ඔබ කණ්ඩායමට සකස් කිරීමට ලැබුණු සංවාද පිටපතේ නම කුමක් ද? (ලකුණු 02)
2. ඔබ කණ්ඩායමේ සිටි සාමාජිකයන් ගණන කීය ද? (ලකුණු 02)
3. සංවාදය ඉදිරිපත් කිරීමේදී ඔබ ලැබූ අත්දැකීම් මොනවා ද? (ලකුණු 03)
4. ඔබ නැරඹූ හෝ ශ්‍රවණය කළ රූපවාහිනී හෝ ගුවන් විදුලි සංවාද දෙකක් නම් කරන්න. (ලකුණු 04)
5. සන්නිවේදනයේ දී සංවාදය වැදගත් වන්නේ ඇයි ? (ලකුණු 05)

② පහත දැක්වෙන මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150 කට නො අඩු රචනාවක් ලියන්න.
1. මම සීගිරි පර්වතය උඩට නැංගෙමි.
2. අවුරුදු නිවාඩුව ළඟයි.
3. රට සරු කරවන ගොවි විරුවෝ
4. පොත් කියවමු දැනුම ලබමු.
5. දිවා කාලයේ අපේ නගරය. (ලකුණු 20)

③ පහත සඳහන් ඡේදයේ පද බෙදා , නිවැරදි විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

තදින්සුළංහැමූඅතරඅකුණුගැසුවේයඅහසකළුකරවැස්සකපෙරනිමිතිපෑවේයගෙවල්වලසිටි
මිනිසුන්වේලන්නටමිදුලටදැමූදේගෙතුළටගත්අතරපාරේඇවිදිමින්සිටිමිනිස්සුඅඩියටදෙකටතමනිවෙස්කරාගියෝ
යසිහින්පොදබිමටවැටුණිඅදමදිනොවන්නටවැසිවසින්නටහැකියයිමටසිතුණිඈතින්හෝහඬඇසෙන්නටවිය
(ලකුණු 10)

④ පහත පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඈත පෙනෙන කඳු පාමුල
පිට්ටනියක හරක් කවන
පුංචි පුංචි ළමෝ පෙළක්
සෙල්ලම් කරතී.

වලාකුළේ හැංගී ඉඳ
වැහි දෙවියන් විසින් එවන
සිරි පොද වැස්සෙන් නිතර ම
කඳු හිස තෙමෙතී.

1. හරක් බලන ළමුන් හැඳින්විය හැකි තනි පදය ලියන්න.

(ලකුණු 02)

2. මෙහි ඇති ප්‍රාණවාචී නාම පද 02 ක් නම් කරන්න.

    1.

    2

(ලකුණු 02)

3. සිරි පොද වැස්ස යනු කුමක් ද?

(ලකුණු 02)

4. 'මුදුන' යන්නට පද්‍ය පන්තියේ එන සමාන පදයක් ලියන්න.

(ලකුණු 02)

⑤ පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(අ) ''අහුවුණා ! අහුවුණා !! හොරා අහුවුණා !!! ''

1. මෙම කොටස ඇතළත් පාඩමේ නම කුමක් ද?

2. එය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?

3. මෙසේ ප්‍රකාශ කළේ කවුද?

4. කාහට ද?

(ලකුණු 04)

(ආ) ''කරුණාකරලා ඒ නීති දහය කෙටියෙන් විස්තර කරනව ද?''

1. මෙම කොටස ඇතුළත් පාඩමේ නම කුමක් ද?

2. බේඩ්න් පවෙල් සාමි වරයා ලියූ පොත කුමක් ද?

3. මෙසේ ප්‍රකාශ කළේ කවුද?

4. කාහට ද?

(ලකුණු 04)

(ඇ)'' මං ඔයාට කියලා දෙන්නම්කෝ බය නැතිව කතා කරන හැටි''

1. මෙම කොටස ඇතුළත් පාඩමේ නම කුමක් ද?

 --------------------------------------------------------------------------------

2. එය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?

 --------------------------------------------------------------------------------

3. මෙසේ ප්‍රකාශ කළේ කවුද?

 --------------------------------------------------------------------------------

4. කාහට ද?

 -------------------------------------------------------------------------------- (ලකුණු 04)

(ඈ)''අල්වාගෙන යොදා ගත මැන, මෙතන මොහුගේ ස්වාමිදරු කෙනෙක් නැත.''

1. මෙම පාඨය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

 --------------------------------------------------------------------------------

2. එය ඇතුළත් ජාතක කතාව කුමක් ද?

 --------------------------------------------------------------------------------

3. මෙසේ ප්‍රකාශ කරන්නේ කවුද?

 --------------------------------------------------------------------------------

4 කාහට ද?

 -------------------------------------------------------------------------------- (ලකුණු 04)